Article 13(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2018 - 2 - 27

පැමිණිලිකාරිය : එච්.පී කරුණාවතී මිය.
බොරළුගම. තුත්තිරිපිටිය.
ගල්අතර.

වගඋත්තරකරුවන් : 01. ස්ථානාධිපති.
පොලිස් ස්ථානය.
මාවනැල්ල.

02. පො.ප එන්.එස් බණ්ඩාර මයා.
පොලිස් ස්ථානය.
මාවනැල්ල.

03 පො.සැ 22404 කිරිවත්ත මයා,
පොලිස් ස්ථානය,
මාවනැල්ල.

<u>පැමිණිලි අංකය</u> : **HRC/K/165/16**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ. තමා මාවනැල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 52053 දරණ නඩුවේ වරෙන්තුකාරිය වන බව අගවමින් මාවනැල්ල පොලීසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක බණ්ඩාර විසින් 2016.03.14 දින තමා අත්අඩංගුවට ගත් බවයි. එහිදී තමාගේ හැඳුනුම්පත හා ලිපිනය පෙන්වීමෙන් මෙම නඩුවේ සඳහන් වන ණය මුදල තමා ලබාගෙන නොමැති බවත් තමාගේ වාසගම 'හදුන්කුට්ටි පේඩිගේ කරුණාවතී' වන බවත්. වෙනත් වාසගම් ඇති කරුණාවතී යන අයවලුන් කිහිප දෙනකු එම ප්‍රදේශයේ සිටින බවත් තමා යුද්ධයේදී මියගිය රණවිරුවෙකුගේ බිරිඳක් වන බවත්. අත්අඩංගුවට ගැනීමට පෙර උසාවියේ ලිපිගොනු බලා නිවැරදි තැනැත්තිය අත්අඩංගුවට ගන්නා ලෙසට දැනුම්දෙද්දීත් පොලිස් පරීක්ෂක බණ්ඩාර මහතා විසින් උදෑසන 9.00 ට පමණ තමාව

අත්අඩංගුවට ගත් බවත් සඳහන් කර ඇත. අනතුරුව සවස 4.00 ට තමාව ගරු අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්. අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු තමා හට එවැනි වරෙන්තුවක් නොමැති බව තමා විසින් දැනුම්දුන් පසු ගරු මහේස්ත්‍රාත්තුමා විසින් පොලීසියට නිවැරදි පුද්ගලයින් ගෙනෙන ලෙසට අවවාද කර තමා නිදහස් කළ බවත් සඳහන් කර ඇත. එසේම තමා අත්අඩංගුවට ගැනීම නිසා තමාගේ දරුවන් ඉදිරියේ ලැජ්ජාවට පත්වීමට සිදුවූ බවත් මානසික වශයෙන් පීඩනයක් ඇති වූ බවත් මෙසේ අත්අඩංගුවට ගැනීමෙන් නිවැරදි පුද්ගලයෙකු වූ තමාගේ මානව හිමිකම් උල්ලංඝනය වී ඇති බවත් මෙම නීති විරෝධී කටයුත්ත සඳහා පොලිස් පරීක්ෂක බණ්ඩාර යන අයට පොලිස් කොස්තාපල්වරු දෙදෙනා සහය වූ බවත් සඳහන් කර ඇති අතර. මෙසේ තමා අත්අඩංගුවට ගැනීමෙන් තමාගේ මානව හිමිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා සාධාරණ අලාභයක් ලබාදෙන ලෙසත් වියදම් වූ නීතිඥ ගාස්තු ඇතුළු වියදම් වූ රු. 6000.00 පමණ මුදල ලබා දෙන ලෙසත් මින් පසු මෙවැනි වැරදි නොකිරීමට එම නිලධාරීන්ට දඬුවම් ලබා දෙන ලෙසත් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

වගඋත්තර පාර්ශවයේ සැලකිරීම් :-

මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ. මාවනැල්ල දිසා අධිකරණය මඟින් 2016.02.15 දිනැති ලියා අත්සන් කරන ලද නඩු අංක 52053 යටතේ සමූපකාර සම්බන්ධ උප කොමසාරිස් විසින් පවරන ලද නඩුකරයක් සඳහා 2016.02.12 වන දින ගරු අධිකරණය වෙත ඉදිරිපත් නොවීම සම්බන්ධයෙන් 02 වන චූදිතකාර වන බොරළුගම තුත්තිරිපිටිය ගල්අතර ලිපිනයේ පදිංචි එච්.පී කරුණාවතී යන නමින් වරෙන්තු පිටපතක් ක්‍රියාකිරීම සඳහා මාවනැල්ල පොලිස් ස්ථානයට ලැබූ බවයි. මෙම වරෙන්තුව සම්බන්ධයෙන් මාවනැල්ල පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයට අනුයුක්තව වැඩ බලන ස්ථානාධිපති වශයෙන් කටයුතු කළ පො.ප බණ්ඩාර නිලධාරියා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් ප්‍රදේශයේ වරෙන්තුකරුවන් අත්අඩංගුවට ගැනීම හා අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධව විමර්ශන රාජකාරී කටයුතු වල යෙදී සිටියදී වසමේ සංචාරයේදී මෙම නඩුවට සම්බන්ධ වරෙන්තුකාරිය සම්බන්ධයෙන් සොයා බලා මෙම තැනැත්තියට පොලිස් ස්ථානයට පැමිණීමට දන්වා ඇති බවත් පසුව පැමිණිලිකාරිය 2016.03.14 වන දින පොලිස් ස්ථානයට ඉදිරිපත් වීමෙන් පසු අපරාධ විමර්ශන අංශයේ වරෙන්තු ක්‍රියාත්මක කරන පො.සැ 22404 කිරිවත්ත නිලධාරියා විසින් මෙම වරෙන්තුව පරීක්ෂා කර බලා එහි සඳහන් ලිපිනය වන බොරළුගම. තුත්තිරිපිටිය. ගල්අතර එච්.පී කරුණාවතී යන නමින් ඇති වරෙන්තුව ඇයට පෙන්වා දී සමූපකාර ණය මුදලක් ලබා ගැනීම සම්බන්ධයෙන් සමූපකාර සංවර්ධන උප කොමසාරිස්තුමා විසින් ගොනුකරන ලද පැමිණිල්ලට අදාළව වරෙන්තුවට අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කරන ලද බවත් දක්වා ඇත. මෙම අත්අඩංගුවට ගැනීමට පෙර ඇගෙන් තොරතුරු විමසන අවස්ථාවේදී මීට පෙර ඇයට විරුද්ධව සමූපකාර කොමසාරිස් කාර්යාලය මඟින් පවරන ලද නඩුවක් අධිකරණයේ තිබූ බවට සනාථ කරගැනීමට කිසිදු ලියවිල්ලක් ඉදිරිපත් කර ගැනීමට ඇය අපොහොසත් වූ බවත්. ඒ අනුව මෙම වරෙන්තුව ඇගේ නමින් නිකුත් වී ඇති බවට තහවුරු වූ හෙයින්ද ස්ථානයේ මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබැලීම සඳහා පොලීසිය සතුව සමූපකාර නඩුවලට අදාළ කිසිදු ලේඛනයක් නොමැති හෙයින්ද මෙම පැමිණිලිකාරිය මෙම

වරෙන්තුව සඳහා නම හා ලිපිනය වරෙන්තුවේ සඳහන් පරිදි අත්අඩංගුවට ගෙන ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත් එසේ අධිකරණයට ඉදිරිපත් කිරීම සම්බන්ධව වරෙන්තුකාරියගේ කිසිදු විරෝධයක් එම අවස්ථාවේ නොවූ බවත්. ගරු අධිකරණය වෙත වරෙන්තුකාරිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම වරෙන්තුකාරිය අධිකරණයේ නියෝග පරිදි මුල් අකුරේ සඳහන් වාසගමේ වෙනසක් ඇති බවට සඳහන් කරමින් මුදාහැර ඇති බවත් දක්වා ඇත. මෙම වාසගමේ ඇති වෙනස්වීම් සම්බන්ධයෙන් සොයා ගැනීමට පොලිස් ස්ථානයේ කිසිදු ලේඛනයක්ද නොමැති අතර මෙම නඩුව පවරන ලද්දේ සමූපකාර කොමසාරිස් කාර්යාලය මගින් බවත්. මේ සම්බන්ධයෙන් පෙත්සම්කාරිය විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ලට අදාළව පොලිසිය විසින් සිදුකරන ලද සියළුම අත්අඩංගුවට ගැනීම් හා අධිකරණ ඉදිරිපත් කිරීම්. රඳවා තබා ගැනීම් ආදී ලේඛන වල උධෘත හා උපුටා ගන්නා ලද ඡායාස්ථ පිටපත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :-**

1. මෙම පැමිණිලිකාරිය නමින් එච්.පී කරුණාවතී (හදුන්කුට්ටි පේඩිගේ කරුණාවතී) වන අතර ලිපිනය බොරළුගම. තුත්තිරිය. ගල්අතර වේ.

2. මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ කෑගල්ල සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් පවරා ඇති අංක 52053/15 (සමූපකාර) යන නඩුවට වරෙන්තුකාරිය වන්නේ එච්.පී කරුණාවතී යන අය වන අතර ලිපිනය මෙම පැමිණිලිකාරියගේම ලිපිනය වේ.

3. පැමිණිලිකාරිය හා වරෙන්තුකාරිය යන දෙදෙනාම එච්.පී කරුණාවතී වන නමුත් <u>වරෙන්තුව නිකුත් වී ඇත්තේ හේවාපේඩිගේ කරුණාවතී යන අයකුට වන අතර පැමිණිලිකාරිය හදුන්කුට්ටි පේඩිගේ කරුණාවතී වේ.</u>

4. 2016.03.12 වන දින පැමිණිලිකාරියගේ නිවසට පැමිණි පොලිස් නිලධාරීන් වෙත තමන්ට එරෙහිව මාවනැල්ල අධිකරණයේ වරෙන්තුවක් නොමැති බව පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටියදී 2016.03.14 දින පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස දැනුම්දීම අනුව පැමිණිලිකාරිය පොලීසියට ගොස් එදිනද තමන්ට එරෙහිව වරෙන්තුවක් නොමැති බව පොලීසියට දැන්වුවද එය ගණන් නොගෙන අධිකරණයට රැගෙන ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

5. අධිකරණයේදී පැමිණිලිකාරියගේ නීතිඥ මහතා හා මාවනැල්ල පොලීසියේ අධිකරණ කටයුතු සඳහා පෙනී සිටින නිලධාරියා එක්ව රෙජිස්ට්‍රාර්වරයා මුණගැසී පැමිණිලිකාරියට එරෙහි වරෙන්තුවක් නිකුත් වී තිබේද යන්න පරීක්ෂා කර ඇති අතර. එහිදී එවැනි වරෙන්තුවක් නිකුත් කර නොමැති බවට කරුණු අනාවරණය වී තිබියදී පැමිණිලිකාරිය අධිකරණයට ඉදිරිපත් කර ඇති බව තහවුරු වේ.

6. අධිකරණයේදී පැමිණිලිකාරිය විසින් තමන්ට එරෙහිව වරෙන්තුවක් නොමැති බව ප්‍රකාශ කිරීමෙන් පසු පැමිණිලිකාරිය නිදහස් කර තිබීමෙන් පොලීසිය විසින් නීති විරෝධී ලෙස පැමිණිලිකාරිය අත්අඩංගුවට ගෙන ඇති බව තහවුරු වේ.

7. පැමිණිලිකාරිය විසින් තමන්ට එරෙහිව වරෙන්තුවක් නොමැති බවත් නම් හා සමාන ලිපින සහිත තවත් කාන්තාවක් සිටින බවට පොලීසියට අවස්ථා කිහිපයකදීම දැනුම් දුන්නද පොලීසිය විසින් ඒ පිළිබඳව කිසිදු විමර්ශනයක් සිදුකර නොමැති බවද තහවුරු වේ.

8. නිකුත් කර ඇති වරෙන්තුවෙහි වරෙන්තුකාරියගේ නම එච්.පී කරුණාවතී ලෙස සඳහන් වන බැවින් එච්.පී නමින් හඳුන්වන මුළු නම පරීක්ෂා කර බැලුවේ නම් එය පැමිණිලිකාරිය වන හඳුන්කුට්ටි පේඩිගේ කරුණාවතී නොවන බවත් එය හේවා පේඩිගේ යන වෙනත් අයකුට අයත් බවත් පැහැදිලිව තහවුරු කිරීමට අවස්ථාව තිබියදී ඒ පිළිබඳ කිසිදු සැළකිල්ලක් නොදක්වා අදාළ වරෙන්තුව පැමිණිලිකාරියට අදාළ බවට පූර්ව නිගමනයක සිට පොලීසිය ක්‍රියාකර ඇති බවට පැහැදිලි වේ.

9. පොලීසිය විසින් කොමිසම වෙත ඉදිරිපත් කර ඇති වාර්තාවෙහි වැඩිදුරටත් සඳහන් වන්නේ මෙම නඩුව සමූපකාර දෙපාර්තමේන්තුව මඟින් පවරා ඇති නඩුවක් වන බවයි. ඒ අනුව අදාළ නඩුව පිළිබඳ සමූපකාර දෙපාර්තමේන්තුවෙන් තොරතුරු විමසා තහවුරු කරගැනීමට අවස්ථාව තිබියදී එය පැහැරහැර ඇති බවද තහවුරු වේ.

නිගමනය :-

මෙම කරුණු අනුව නිකුත් වී ඇති වරෙන්තුවට අදාළ පුද්ගලයා කවුරුන්ද යන්න පැහැදිලිව තහවුරු කර ගැනීමට අවස්ථාව තිබියදී කිසිදු සොයා බැලීමකින් තොරව වෙනත් අයකුගේ වරෙන්තුවක් සඳහා පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13(1) වන ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති නීති විරෝධී ලෙස අත්අඩංගුවට පත් නොවීමට ඇති මූලික අයිතිවාසිකම පැමිණිලිකාරිය සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

දෙවන වගඋත්තරකරු විසින් පැමිණිලිකාරිය වෙත රු. 15,000/- වන්දි මුදලක් ගෙවිය යුතුය.

2018.03 .27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/